පාෂාණයෙන් ඈතට - මහාචාර්ය සී.බී. දිසානායකයන්ගේ ජීවිතය සහ එතුමන් උරුම කළ දායාද

මහාචාර්ය රෝහණ චන්ද්‍රජිත්



ශ්‍රී ලංකාවට ඉමහත් කීර්තියක් අත්කරදුන් ශ්‍රේෂ්ඨ විද්‍යාඥයන් අතර ඉහළින්ම සිටි අයෙකු ලෙස මහාචාර්ය සී.බී දිසානායකයන් හැඳින්විය හැකිය. දේශනාගාර සහ විද්‍යාගාර අබිබවා පැතිර ගිය දැනුම් සම්භාරයක් හිමි කරගත් මෙරට පුරෝගාමී භූ විද්‍යාඥයෙකු ලෙස එතුමන් සිහිපත් කෙරේ. ඔහුට හිමිව තිබූ අධ්‍යාපන උපාධි සමූහයට හා ගෝලීය පිළිගැනීමට පසුබිමෙහි සිටියේ තම පවුලට සෙනෙහසින් බැඳුන නොසංසිදෙන දැනුම් පිපාසයක් හිමිව තිබූ මහා පෞරුෂයකි. එතුමන් භූ විද්‍යා ක්ෂේත්‍රය තුළ අද්විතීය දැවැන්තයෙකු වුවද සෞම්‍ය, නිරහංකාර හා නිර්ලෝභී ගතිගුණ වලින් හෙබි තැනැත්තෙකු ලෙස එතුමන් තවත් බොහෝ අයගේ ජීවිත දීප්තිමත් කිරීමට ඵලදායී ලෙස කටයුතු කළ උතුම් පුද්ගලයෙකු ලෙස හැඳින්විය හැක. මහාචාර්ය සී.බී දිසානායක මහතා අප සිහිපත් කළ යුත්තේ ඔහු අත්කරගත් අද්විතීය විද්‍යාත්මක ජයග්‍රහණ නිසා පමණක් නොව ඔහු තුළින් විද්‍යාමාන වූ සෙනෙහවත් මානුෂීය ගුණාංග පෙරදැරිවය.

මහාචාර්ය සී.බී දිසානායකයන් සිය ජීවනගමන ඇරඹුයේ අධිශ්ඨානශීලී දරුවකු ලෙසය. 1944 ජනවාරි මස 8 වන දින කුරුණෑගල උපත ලද එතුමන් මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙහි අධ්‍යාපනය හැදෑරුවේය. ලංකා විශ්වවිද්‍යාලයේ පේරාදෙණිය මණ්ඩපයට 1964 වර්ෂයේදී එතුමා ඇතුළත් වූ අතර ඔහුගේ අධ්‍යාපනිකමය විශිෂ්ඨතාවය කැපී පෙනීම එහිදී ඇරඹිණ. ආරම්භයේදී රසායන විද්‍යාව ඉගෙනගත් එතුමා ඉන්පසු තම "සහජ උරුමය" වූ භූ විද්‍යාව හැදෑරුවේය. ශ්‍රී ලංකාව තුළ භූ විද්‍යාවෙන් පළමු පන්තියේ ගෞරව උපාධියක් හිමිකරගත් ප්‍රථම ශිෂ්‍යයා වීමේ ගෞරවය එතුමා දිනාගත්තේය. එය විශිෂ්ඨත්වය පෙරදැරිකරගත් භූ විද්‍යාව සඳහා වූ ඉදිරි ගමනක පෙර දැක්මක් විය. සිය අධ්‍යාපනය ලැබීමේ ඊළඟ පියවර සඳහා ඔහු ඇතුළු වූයේ එංගලන්තයේ ඔක්ස්වර්ඩ් සරසවියටය. එහිදී භූ රසායනය පිළිබඳ දර්ශනපති උපාධිය දිනාගැනීමට ඔහු සමත්විය. එතැනින් නොනැනවතුන ඔහුට ඔක්ස්ෆර්ඩ් සරසවිය 1991 දී, ප්‍රායෝගික භූ රසායන විද්‍යාවට, විශේෂයෙන්ම පරිසර හා ජල භූ රසායනිකමය යන ක්ෂේත්‍රයන්ට සිදු කළ සුවිශාල දායකත්වයට ගරු කරමින් විද්‍යාපති උපාධියක් (Doctor of Science) පිරිනැමීය.

ශ්‍රී ලංකාව තුළ මහාචාර්ය දිසානායකයන්ගේ වෘත්තීමය ජීවිතය පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමග ඉතා සමීපව බැඳී පැවතින. කථිකාචාර්යවරයෙකු, මහාචාර්යවරයෙකු, පරීක්ෂකයෙකු සහ භූ විද්‍යා අංශයේ ප්‍රධානියා ලෙස ගෞරවනීය සේවාවක් ඉටු කිරීමට ඔහු සමත්විය. එහි ගතකළ දශක ගණනාව තුළ පරම්පරා ගණනාවක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දැනුම හිමිකරන්නට පමණක් නොව ශ්‍රී ලංකාවේ භූ විද්‍යා ක්ෂේත්‍රයට ජාත්‍යන්තර අවධානය ලබගැනීමට සමත්වූ පර්යේෂණ ගණනාවක් සිදු කිරීමටත් එතුමන් සමත් විය. පරිසර රසායන විද්‍යාව, වෛද්‍යමය භූ විද්‍යාව, භූ ගත ජල සම්පත් අධ්‍යයනය හා ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් ආදී ක්ෂේත්‍ර ගණනාවක් හරහා ඔහුගේ පර්යේෂණ පරාසය විහිදින. වඩාත් වැදගත් වන්නේ ඔහුගේ පර්යේෂණ සමාජයීය අවශ්‍යතාවයන් මත පදනම් වීමය. උදාහරණයක් ලෙස ජලයේ ගුණාත්මකභාවය සහ එය මානව සෞඛ්‍යයට බලපාන ආකාරය පිළිබඳ සිදුකළ පර්යේෂණ දැක්විය හැකිය. ජාත්‍යන්තර සඟරා ප්‍රකාශන 200 කට වැඩි සංඛ්‍යාවක ඔහුගේ විද්‍යාත්මක ලිපි පළව ඇති අතර ඔහුගේ කතෘත්වයෙන් ප්‍රකාශයට පත්ව ඇති ශාස්ත්‍රීය ග්‍රන්ථ සංඛ්‍යාවද විශාල ප්‍රමාණයකි. මහාචාර්ය දිසානායකගේ විද්‍යාත්මක දායකත්වයන් ඉතා පුළුල් පරාසයක් ගන්නා අතර ඒවා මගින් ඇති කර බලපෑමත් සුවිශාලය. ලොව

පුරා පැවැත්වුනු සම්මන්ත්‍රණ වලදී ඔහු ඉදිරිපත්කර ඇති පර්යේෂණ පත්‍රිකා 100 කට අධිකය. ඒවා තුළින් ගෝලීය භූ විද්‍යා ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවට නමක් හිමි කර දීමට එතුමා සමත් විය. එමෙන්ම ඔහුගේ පර්යේෂණ ක්ෂේත්‍ර කිහිපයක් හරහා පැතිරුණි. භූගත ජලයේ භූ රසායන විද්‍යාව සහ මිනිරන්, මැණික් සහ රත්‍රං නිධිවල සම්භවය ඒ අතරින් කිහිපයකි. ඔහුගේ කර්තවයේ විද්‍යාත්මක අවබෝධය පුළුල් ලෙස සමාජයටද මහත් ඵල ප්‍රයෝජන අත්කර දුන්නේය. ශ්‍රී ලංකාවේ 'හයිඩ්‍රෝජියෝ කෙමිකල්' සිතියම ඔහුගේ අද්විතීය ක්‍රියාකාරකමකි. එය ප්‍රකාශයට පත් කරනු ලැබුවේ ජාතික විද්‍යා පදනම මගිනි. එතුමන් රචනා කළ භූ වෛද්‍ය විද්‍යා හැඳින්වීමක් නම් කෘතියක් නම් ජර්මනියේ ස්ප්‍රින්ගර් (springer) ආයතනය මඟින් ප්‍රකාශයට පත් කළේය. මේ සියල්ලට අමතරව ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් විශේෂයෙන්ම මැණික් සම්පත් පිළිබඳ කෘති කිහිපයක්ම සම්පාදනය කිරීමටද ඒතුමන් සමත් විය.

සිය පෞද්ගලික ජීවිතයේදී මහාචාර්ය දිසානායක ආදරණීය සැමියෙකු සහ දයාබර පියෙකු විය. සිය පවුල් ජීවිතයේ සාර්ථකත්වය සඳහා ඔහු බෙහෙවින් කැප විය. කාර්ය බහුල වෘත්තීය ජීවිතය මධ්‍යයේ වුවද ඔහු සිය බිරිඳට සහ දියණියට බොහෝ සමීප වූ ජීවිතයක් ගත කළේය. සිය ගෘහ ජීවිතය තුළ උනන්දුව, දයාව, කුතුහලය පිරි ඉගෙනුම් පරිසරයක් පවත්වාගෙන යාමට ඔහු වෙහෙසුනේය. එතුමන්ව පෞද්ගලිකව දන්නා හඳුනන අය ඔහුගේ ත්‍යාගශීලීත්වය, කරුණාභරිතභාවය සහ බොහෝ දෙනෙකු එක් රැස් කර තබා ගැනීමේ හැකියාව අත්දකින්නට ඇත. ඔහුගේ සමකාලීන ශිෂ්‍යයන් හා මිත්‍රයන් ඔහුගේ සංග්‍රාහශීලිත්වය සහ අව්‍යාජ මානව බැඳීම් බුක්ති විඳින්නට ඇත. තම වෘත්තීමය විජයග්‍රහණය දෙස සැහැල්ලුවෙන් බැලූ මහාචාර්යතුමන් ඒ කිසිවකට තමන් සතුවූ මානව දයා ගුණාංග අබිබවා යාමට ඉඩ නොදුන්නේය.

සමස්ත ලෝකයෙන්ම එනම් ගෝලීය වශයෙන් කොතරම් පිළිගැනීමක් තිබුනේද එතුමන්ගේ මුල් ඇදී තිබුනේ ශ්‍රී ලංකාව තුළටමය. ඔහු සිය ජීවිතය කැප කළේ සිය දැනුම වර්ධනය කර ගැනීමට සහ පේරාදෙණිය සරසවියේ විද්‍යාර්ථීන් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ තරුණ මනස් පෝෂණය කිරීමටය. දශක කිහිපයක් තුළ කිහිපවාරයක්ම මහනුවර ජාතික මූලික අධ්‍යයන ආයතනයේ (NIFS) අධ්‍යක්ෂවරයා ලෙසද එතුමා කටයුතු කළේය. පරම්පරා ගණනාවක ශිෂ්‍යයන් එතුමන් අගය කරනු ලැබුවේ ඔහුගේ බුද්ධිමත්භාවය මෙන්ම යථාර්ථවාදී සහ අර්ථවත් ලෙස ඉදිරිපත් කරමින් ඔවුන්ව දිරිගැන්වීමට ඔහු තුළ පැවති හැකියාවන් මුල් කරගෙනය. දැනුම සමස්ථයට යහපතක් සැලකිය යුතු බව ඔහුගේ විශ්වාසය වූ අතර එතුමන්ගේ කාර්යභාරය එම අදහස් සාක්ෂාත් කිරීමට යෙදවූහ. පොදු සමාජය සමඟ වූ ඔහුගේ බැඳීමද එලෙසම අද්විතීයය. මහනුවර සිංහ සමාජය, නුවර ඇලයන්ස් ප්‍රෑන්කේටිස් ඇතුළු විවිධ ආයතන සමඟ ඔහු සුභ සාධනමය පුණ්‍ය ක්‍රියා සහ සංස්කෘතික මූලාරම්භයන් තුළ කැපී පෙනෙන මෙහෙවරක් ඉටු කළේය. ශ්‍රී ලංකාවේ භූ විද්‍යා සංගමයේ සභාපතිවරයා ලෙස නායකත්ව කාර්යභාරයන් ඉටු කළ ඔහු තවත් විද්‍යාත්මක හා ප්‍රජා සංවිධාන කිහිපයකම ක්‍රියාශීලීව කටයුතු කළේය. රට තුළ විද්‍යාත්මක පර්යේෂණ සහ



ජන අවබෝධය නංවාලීමට ඔහුගේ නායකත්වය උපකාරී විය.

මහාචාර්ය දිසානායක ශ්‍රී ලංකාවට සහ භූ විද්‍යා ක්ෂේත්‍රයට සිදුකළ සුවිශේෂ දායකත්වයන්ට විවිධ ගෞරව සම්මාන ප්‍රදානයන් ගණනාවක්ම හිමිකර ගත්තේය. ඒ අතර විද්‍යාත්මක විජයග්‍රහණ හා සම්බන්ධව ශ්‍රී ලාංකිකයෙකුට හිමිකරගත හැකි ඉහළම ජාතික සම්මානය වන ''විද්‍යා ජෝති" සම්මානයද ඇතුළත්ය. මේ අතර පේරාදෙණිය සහ සබරගමු විශ්ව විද්‍යාලය මඟින් එතුමන්ට සම්මාන ඩොක්ටර් ඕෆ් සයන්ස් (Doctor of Science) ගෞරවයන් පිරි නැමූ බවද සැලැකිය යුතුය. එතුමාගේ අධ්‍යාපනික විශිෂ්ඨත්වය පමණක් නොව විද්‍යාවට සහ සාමාජයට එතුමන් සිදු කළ කිසිදා සිදී නොයන අමරණීය කාර්ය සමූහයම අගයමින් තවත් බොහෝ සම්මාන රාශියක් පිදුම් ලැබූවෙකි. ඒ අතර ජර්මනියේ ඇලැක්සැන්ඩර් වොන් හුම්බෝල්ඩ්ට් පදනමෙන් (Alexander Von Humboldt Foundation) ලැබූ සම්මානය මෙන්ම ලෝක විද්‍යා ඇකඩමියෙන් සහ ශ්‍රී ලංකා විද්‍යා ඇකඩමියෙන් පිදූ සම්මාන ද්විත්වයද හැඳින්විය හැක. මහාචාර්ය සී.බී. දිසානායකයන් රටට දායාද කර ඇත්තේ ඔහුගේ විද්‍යාත්මක ජයග්‍රහණයන්ගෙන් පමණක් නොවේ. එතුමන් ජීවිතය ගත කළ ආකාරය, ඔහුගේ ත්‍යාගශීලීත්වය සහ අරමුණු ද ඒ සමගම රටට උරුම කෙරිණ. ශ්‍රී ලංකාව තුළත් බැහැරත් භූ විද්‍යාව හැඩ ගස්වන්නට ඔහුගේ දායකත්වය අදටත් බලපාමින් පවතින අතර එතුමාගේ පෞද්ගලික අගයන් අප සැමගේ ජීවිත අභිප්‍රේරණය කරමින් තවමත් පවතියි.

මහාචාර්ය දිසානායකයන් අද අප අතර නැතත් ඔහු අධ්‍යයනය කළ මෙම පෘථිවිය පරිදිම ඔහුගේ අභාසය අප තුළට කාවැදී ඇති අතර ඒවා සදහටම අප අතර පවතිනු නිසැකය. අධිෂ්ඨානයෙන් සහ අරමුණින් ජීවත් වීමේ අවශ්‍යතාවය අපට බලවත් සේ සිහිපත් කරවන්නෙක් ලෙස එතුමන්ගේ ජීවිතය සැලකිය හැකිය. ඔහු විශිෂ්ඨත්වය හඹා ගියේ පෞද්ගලික ඵල ප්‍රයෝජන තකා නොව අන්‍යයන්ට යහපතක් කිරීම සඳහාය. සිය දැනුම, කාලය සහ කරුණාව සියලු දෙනා වෙත නොපැකිලිව වැය කළේය. එමගින් එතුමන් ජීවත් වූ කාලය ඉක්මවා යන උරුමයක් රටට හිමි කර දුන්නේය. අප ඔහුට සමු දෙන්නේ විශිෂ්ඨ ගුණාංගයන්ගෙන් පරිපූර්ණ වූ විද්වතෙකු , සඳාකාලිකව පවතින බලපෑමක් ඇතිකළ ගුරුතුමෙකු, මෙන්ම අති විශිෂ්ඨ ගුණාංගයන්ගෙන් සමන්විත වූ මනුෂයෙකු , ලෙස ඔහු අප අතර නොමැති වීම බලවත් අඩුවක් ලෙස දැනුනත් එතුමාගේ ආත්මය නිහඬව එහෙත් ක්‍රමවත්ව හා බලවත්ව අප මෙහෙයවනු ඇත්තේය. මහාචාර්යතුමන් අප අතර නොසිටියද එතුමන් දැල්වූ පහන නොනිවී පවතිනු ඇත්තේය.



මහාචාර්ය රෝහණ චන්ද්‍රජිත්
භූ විද්‍යා මධ්‍යස්ථානය
භූ විද්‍යා දෙපාර්තුමේන්තුව
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

